Page 8 November 2008 .qxd 30/10/2008 08:08 Page 1



## කවි කොළය

# වෙදකම සුදුසු නැත මේ මස් වැද්දන්ට!

දොස්තර එදා දුන් ලෙඩුනට සැන සිල්ල
අරගෙන අතට අද වැඩ වර්ජන පොල්ල
අසරණ රෝගියා කරගෙන නර බිල්ල
ලේ බොන්නට හදයි මිරිකාගෙන බෙල්ල!

කඩුවක් කුමට නැසුමට මදුරුවෙකු කුඩා
කටයුතු නොකළ යුතු මිය යන තැනට ලෙඩා
දොස්තරකමත් කොන්දොස්තර කමට වඩා
මේ වැඩ නිසා පහළට ඇද වැටුණි කඩා

වැදගත් ඇතැම් හොඳ දොස්තරවරු මේවා
පිළිකුල් කළද ඒ අයවද පසු බාවා
මුදලට වහල්වුණු යුනියන් උරු ලෑවා
දොස්තරකමේ පැවතුණු නම්බුව කෑවා

බෙහෙතක වෙළඳ නාමය මිස නියම නම
නොලියති බොහෝ දොස්තරවරු සිහළ බිම
පාමසියෙනුත් එයි ගාණක් නිබඳ වම
දෝරේ ගලයි මුදලට ඇති මසුරු කම

හත් අට සීය නැතිනම් නිල් කොළ දාහේ
ඉල්ලයි චැනල් කෙළියෙදි දොස්තර වාහේ
කුණුවී දුගඳ පැතිරෙයි ජාතික දේහේ
ලොකු ලොක්කෝද පසුවෙති වහගෙන නාහේ

රජයෙන් ලබාගෙන මුළු මාසෙම පඩිය
හවසට චැනල් යන්නයි මේ කඩි මුඩිය
පිම්බෙන නමුත් ඉන් තරකරගෙන මඩිය
නොබලයි ලෙඩා තත්පර හැටකට වැඩිය

දවසට ලක්ස දෙක උපයන සහසුද් දෙන්
සමහරු කෝටි පතියෝ වෙති අවුරුද් දෙන්
පර්මිට් කාර් එක ටිංගයි ඒ මැද් දෙන්
දොස්තර නිදහස්ය ආදායම් බද් දෙන්

කණ්ණාඩිය නැතොත් කාවය තිබෙන කඩේ
දොස්තර ලියයි එතැනින් ගත යුතුය වැඩේ
දමමින් මැහුම් බැම් සුවපත් කළද ලෙඩේ
කතුරයි ගෝස් නූලයි ඇත තවම බඩේ


වැඩි පඩි නිළ ඇඳුම් ඕ ටී නැත ඉල්ලා
උරහිස තුවක්කුව පතරොම් වැල එල්ලා
දිවි පුද දෙද්දි උතුරේ රණවිරු කොල්ලා
වර්ජන කරයි මෙහි දොස්තර බිසි බිල්ලා

කන්නන්ගරට මතු බුදුබව අත් වෙන්ට
ඉගෙනුම ලබා - දී පිටරටටත් යන්ට
ආපසු නොඑන සෙත සලසන සුද්දන්ට
වෙදකම සුදුසු නැත මේ මස් වැද්දන්ට

බාරව සිටින මෙරටෙහි
ඉස්පිරි තාල
එඩිතර ඇමතිවර-
යාණෙනි සිරි පාල
කෙරුමට මෙල්ල
මොවුනගෙ මේ වැඩ බාල
ඇත්තේ ඔබ ළඟය
රූ නටවන නූල!



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



# සක්විතිලා සිය ගණනක් සිටින බවකි

**ආ**යෝජකයන්ගේ මුදල් රුපියල් කෝටි 900 ක් ද සමග රටෙන් පැනගිය සක්විති රණසිංහ නමැති ඉංග්‍රීසි ටියුෂන් මාස්ටර් ගැන තවම කිසි තොරතුරක් නැත. ඔහු අල්ලන්නට ජාත්‍යන්තර පොලීසියට තොරතුරු සපයා ඇතත් මේවන තෙක් ඔහු ඇල්ලූ බවක් නැසේ. සක්විතිගේ පෙනුමට කතාවට හා හැසිරීමට රැවටුණෝ සාමාන්‍ය ජනයා පමණක් නොවෙති. විවිධ සමාජ තරාතිරම්වල අය වෙති. ඒ අතර ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෝ ද, විශේෂයෙන් චැනල් මාර්ගයෙන් මුදල් උපයන දොස්තරවරුද සිටින්නාහ. මෙම දොස්තරවරුන් ලක්ෂ ගණන් මුදල් සක්විතිගේ ආයතනයේ තැන්පත් කළේ බැංකුව ගෙවන ගාණට වඩා විශාල පොලියක් ඔහු දෙන බව කියා තිබූ නිසයි. ඊටත් වඩා දොස්තරවරුන් ගේ ඉපැයීම් ආදායම් බදු දෙපාර්තමේන්තුවට අසුනොවන නිසාත්ය. දැන් දොස්තරවරු බෙහෙත් බිව් ගොළුවන්සේ වීරිත්ත ගෙන සිටිති. ඔවුන් කිසිවෙකු සක්විති ගැන පොලීසියට පැමිණිලිකර නැත. හේතුව එතරම් මුදල් කොහෙන්දැයි එළිවන නිසා ය.

තවත් පොඩි සක්විතිලා සිය ගණනක් ලංකාවේ විවිධ පළාත්වල සිටින බවත් ඔවුන් ද සාමාන්‍ය ප්‍රමාණයට ජනතාවගේ මුදල් ගසාකා ඇතිබවත් ඊට වැඩියම අසුවන්නේ මැද පෙරදිග සිට එන කාන්තාවන් බවත් සොයාගෙන ඇත. මෙතරම් වංචාවන් රටේ සිදුවෙද්දී රජය ඒවා මඩින්නට කිසිදු පියවරක් ගෙන නැත.

# කොළඹට ගුවනින් කොටි බෝම්බ

**ප**සුගිය මස 28 වෙනි දින රාත්‍රියේ කොටි ත්‍රස්තවාදීන් ගුවන්යානා දෙකකින් පැමිණ කැළණියේ විදුලි බලාගාරයකට හා මන්නාරමේ යුද හමුදා කඳවුරකටද බෝම්බ හෙලා ඇත.

කැළණිතිස්ස තාප බලාගාරයේ යන්ත්‍ර සිසිල් කරන විදුලි පංකා දෙකකට කොටි සැහැල්ලු ගුවන්යානා දෙකකින් බෝම්බ දෙකක් හෙලා ඇතත් විදුලි පද්ධතියට කිසිදු හානියක්නැතැයි විදුලිබල ඇමැති ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න කියයි. ඔහු පැවසුවේ ආරක්ෂක පියවරක් වශයෙන් කොළඹ හා අවට විදුලිය විසන්ධි කළ බවයි. මන්නාරම තල්ලඩි කඳවුරට බෝම්බ දැමූ කොටි යානා දෙකම මේ බෝම්බ දැමීමට සම්බන්ධයැයි ද ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය කියයි. කොළඹට පැමිණි කොටි යානා දෙක ආපසු මන්නාරම දෙසින් ගිය බව ද කියති. තල්අඩි හමුදා කඳවුරට කොටි දැමූ බෝම්බවලින් බරපතළ හානියක් සිදු වී නැතැයිද, සෙබළුන් දෙදෙනෙකුට සුළු තුවාල සිදුවී ඇතැයි ද ආරක්ෂක අංශය ප්‍රකාශ කරයි.

කොටි මේ බෝම්බ දැම්මේ හත්වෙනි වතාවට බව ද, පැය දෙකක් උන් ගුවනේ ඒ මේ අත ගොස් ඇතැයි ද, උන් බිම දමන්නට අපේ ගුවන් හමුදාවට නොහැකිවීම ලැජ්ජාවක් බව ද මෙහිදී එජාප මන්ත්‍රීවරයෙකු වන දයාසිරි ජයසේකර මහතා පවසා ඇත.

## කොළඹ විත්ති

### කොටි යානා එන්නේ කොහෙන්ද?

**කො**ටි ත්‍රස්තවාදීන්ට ගුවන්යානාද ඇති බව ඒ කාලයේ කටකතාවක් වීය. එහෙත් පසුව එය ඇත්තක් වීය. කලින් සිටි එයා මාෂල් කීවේ ඒ යානාවලින් ඒතරම් වැඩක් කළ නොහැකි බවයි. එහෙත් ලංකාගුවන් හමුදාවේ කනෙන් රිංගා යමින් දමන බෝම්බ වලින් ඔප්පු වුණේ උන්ටද බොහෝ වැඩ කළ හැකි බවයි. කොටි ගුවන්පථය ඇත්තේ ඉරණමඩුවේ යයි කීවේය. ඉරණමඩුව හමුදාව අතට පත්ව ඇතත් එහි කිසිදු අහස් යානයක් නොවීය. සමහරු කියන්නේ මේ යානා එන්නේ ඉන්දියාවේ සිට බවයි. එය අප නොසිතූ ඇත්තක් විය හැකිය.

### බෝම්බවලින් විදුලිබලාගාරයේ ඇතුළතට හා වහලට සිදුවී ඇති හානි







**ඉරිදා**- පෙරේදා පාලිතයි නන්දනියි දෙන්නා අපේ දිහා
**SUN** ආවා. ලංකාවෙ තත්වෙ ගැන පාලිත පුදුම කැක්කුමකින් කතා කළේ. නන්දනී කියනවා මෙයා සිංහළකම වෙනුවෙන් පණ වුනත් දේවි කියලා. කොළඹ නමගිය සිංහළ බෞද්ධ ස්කෝලෙකලු ඉගෙනගෙන තියෙන්නෙ. පුටුව උඩ තිබුණු සිංහළ පත්තරයක් අරගෙන ඒක දිහා බලලා පැත්තකින් තිබ්බා. සිංහළ කියවන්න බැරිද කියලා මම ඇහුවා. අපොයි පුළුවන් ඒවුනාට සිංහළ අකුරුවලට ආස නැහැ කියලා පාලිත කිව්වා. ඒ මොකද කියලා ඇහුවම කියනවා. සිංහළ අකුරු රවුම් නිසා කියවන්න බැරිලු. නන්දනී කියනවා මෙයා රවුම් හැඩය තියන කිසි දේකට ආස නැහැ කියලා. කැවුම් අග්ගලා කන්නෙ නැතිලු රවුම් නිසා. අළුවා දොදොල් ජාති කනවලු හතරැස් තුන්හුලස් නිසා. කාර් එකක් ගන්නෙ නැහැ කිව්වා, ටයර් රවුම් නිසා. මම නන්දනීට කිව්වා ළඟදිම හතරැස් රෝද එක්ක කාර් ඒවි, සිංහළත් හතරැස් වේවි, එතකං මෙයාව දොස්තර කෙනෙකුට පෙන්නන්න කියලා.

**සඳුදා** - කොටපොල පුංචි අම්මලගෙ ගමේ පුරාණ රජමහ
**MON** විහාරෙ පෙරහැර ගියමාසෙ තිබුණ කියලා සුවර්ණා නංගි ලියලා එවලා තියෙනවා. ලෙඩ ඇඳේ හිටපු ගුණවර්ධන මහප්පත් උස්සගෙන ගිහිං පෙරහැර පෙන්නන්න. එතනදි මහප්පා එක වදේලු අලිය පිට යන්න ඕන කියලා. පස්සෙ වදෙන් බේරෙන්න බැරිම තැන, මෙන්න අලිය කියලා එතන නවත්තලා තිබ්බව ලොරියකට නග්ගවල වාඩිකරවලා. කරුවලේ හන්ද මහප්පට තේරිලා නෑ ඒ ලොරියක් කියලා. ඒ පාර කෑගහනවලු මොකද බං මේ අලිය හෙලවෙන්නෙවත් නැත්තෙ කියලා. රතු මාම කිව්වලු අලිය මේ කිතුල් බඩ කන වෙලාව කියලා. එහෙනම් මාව බස්සවපල්ලා කිව්වම, රතු මාමලා යන්තම් බිමට බාගෙන තියෙනවා. මහප්පගෙත් තියෙන විකාර.

**කුජදා** -මේ ළඟදි ලන්ඩනයෙ පැවැත්වුණු වැදගත් ශ්‍රීලංකා
**TUE** උත්සවයකට ගිය කීප දෙනෙක් කිව්වා, එතනට ඇවිත් හිටියයි කියලා අපේ ජනාධිපතිතුමාගෙ එක පුතෙක්. නිකම් කොළඹ ක්ලබ් එකකට යනව වගේ කමීසෙ නිකම් උඩින් දාගෙන, කරේ මුදලාලිලා දාන වර්ගයේ ලොකු රත්තරං චේන් එක පේන්න, රැවුල කපන්නෙත් නැතුව. ඇයි මේ හාදයට කවුරුවත් ඉගැන්නුවෙ නැත්තෙ වැදගත් තැනකට යනකොට වැදගත් විදියට යන්න කියලා, විශේෂයෙන් තාත්ගෙ නම්බුව තියන්න. එතන හිටි කීප දෙනෙක් ඒගැන කතාවෙලා තියෙනවා. හරියට අඳින්නෙ නැත්නම් එහෙම තැනකට යන්න එපා.

**බුදදා-** ලංකාව දැන් හොරුන්ගෙයි කපටින්ගෙයි ස්වර්ග
**WED** රාජ්ජය වෙලා. රාගම අජිත් මල්ලිගෙ ගෙදර වැඩට කෙනෙක් හොයල දෙන්න අඳුරන කෙනෙක් පොරොන්දු වෙලා. සුනාමියෙන් අනාථ වෙච්ච ගෑණු කෙනෙකුත් ගෙනැත් පෙන්නලා, හෙට ඉඳලා වැඩට එන්නත් ඒ ගෑණු කෙනා පොරොන්දු වෙලා. අජිත් මැන්ට රුපියල් පන්දාහක් දීලා. පන්දාහත් නෑ. වැඩකාරයත් නෑ. අර අඳුරන කෙනත් නෑ. ටෙලිපෝන් කළාම අනේ සර් මට සනීප නෑ කියලා ඒ මිනිහා කෙඳිරිගගා උත්තර දෙනවලු. ගෙවල් විසිපහකින් විතර අර ගෑණු කෙනාව පෙන්නලා, හෙට වැඩට මෙයා එනව කියලා සල්ලි අරගෙන. ලංකාව හදන්න බැරි කපටින්ගෙ ප්‍රමාණෙටම සමානව ඒවට අහුවෙන මෝඩ මැටිමෝල් පිරිසකුත් ඉන්නවා.

**ගුරුදා** -හින්දු පත්තරේ ලිපියක් තිබුණා ඉන්දියාවෙ තමිල්
**THU** නාඩුවෙ දෙමළ මිනිස්සු ප්‍රභාකරන්ව උදේ හවස අදහනවයි අළුත ඉපදුණු දෙමළ ලමයින්ට දාන්නෙ ප්‍රභාකරන්ගෙ නමලු. දැනටම ප්‍රභාකරන් නම තියෙන දාස් ගණනක් ඉන්නවයි කියලා. මං හිතන්නෙ ඒ දරුවන්ට ඉපදිච්ච ගමන් පංචායුදේ වගේ සයනයිඩ් කරළකුත් බෙල්ලෙ දාවි. වැඩේ හිතුවට වැඩිය භයානකයි. ඉන්න වේළුපිල්ලෙ හෙට අනිද්ද කපෝතිය ගැහුවත් ඉදිරි අනාගතේ තමිල් නාඩුවෙන් තව ප්‍රභාකරන්ලා එළියට ඒවි. ලංකාව දැන්ම හිට මේ ගැනත් හිතුවොත් හොඳයි.

**කිවිදා-** ලලිතා දීපු ලංකාවෙ ටෙලි නාට්‍ය කීපයක් මං
**FRI** බැලුවා. ඒ හැම එකකම රඟපාන අයගෙ මූණෙ කිසි හිනාවක් නෑ. විශේෂයෙන් ගෑණු උදවිය අඩාගත්තු ගමන්මයි. එහෙම නැත්නම් ලෙඩවෙලා වගේ රෙදි පොරව ගෙන, විරිත්ගෙන, ශරීරයේ ලොකු අමාරුවකින් වගේ, හති දදා කතා කරනවා. ඒ ටෙලිනාට්‍ය දැක්කම සංසාරෙ එපාවෙනවා. එහෙම තමයි ඒවයි රඟපෑම. මහ ගිනි දවාලෙ දාඩිය දාගෙන පුල් සූට් ගහගෙන ඉන්නවා. ඒ කතාවල හැටියට කිසිකෙනෙක් රස්සාවක් කරන බවක් නම් පේන්න නෑ. හමුදාවෙ හාදයෙක් පෙන්නුවා. මිනිහ හැම තිස්සෙම ඉන්නෙ මූදුවෙරළෙ හමුදා සූට් එකෙන්ම පෙම්වතියක් එක්ක කතාකර කර. ඔහොම හටයො මේ දවස්වල ලංකාවෙ ඉන්නවද? අරහෙ හෝ ගාලා යුද්ධෙ යනවා. මේ ටෙලිනාට්‍යවල දෙබස් බාගයක් සිංහළ, බාගයක් ඉංග්‍රීසි. සිංහලෙන් කියලා ඒකම ආයි ඉංග්‍රීසියෙන් කියනවා. මං හිතන්නෙ ටියුෂන් යන ළමයින්ගෙ පහසුව තකා වෙන්න ඇති. නාට්‍යයත් බලනවා, ශ්‍රී ලංකාවෙ රටවැසියා ඉංග්‍රීසිත් ඉගෙන ගන්නවා. මරු අදහස !